163502

# පුස්තකාල ප්‍රවෘත්ති

පටුන


* "අපේ කාලයේ දැනුම"
  20 වන සියවසේ අපර භාගයේ තාක්ෂණික චින්තනය
  පිළිබඳ පොත් ප්‍රදර්ශණයක් 1 - 3

* 1978 වර්ෂයේදී ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා
  මණ්ඩලයේ පුස්තකාල සේවා ප්‍රගතිය 5 - 21

* ග්‍රන්ථ කෝෂ 23 - 29


ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලයෙන්
පිරිනැමෙන තුටුපඬුරකි

6 වන කලාපය - අංක: 3/4 1978 ජූලි/දෙසැම්බර

ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය

163502

# පුස්තකාල ප්‍රවෘත්ති

## ත්‍රෛමාසික ප්‍රකාශනය

6 වන කලාපය - අංක: 3/4          1978 ජූලි/දෙසැම්බර්

ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය
[illegible], [illegible] කාර්යාලය
කොළඹ - 10.          [illegible] 31332

මෙහි පළ වන අදහස් අනිවාර්යයෙන්ම ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලයේ අදහස් නොවන අතර, ඒ පිළිබඳ වගකීම අදාල ලේඛකයන් වෙත පැවරේ.

සියළුම ලිපි හා විමසීම්:

ජාතික පුස්තකාල සේවා අධ්‍යක්ෂ
ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය
තුන්වන මහල, මාලිගාවත්ත මහ ලේකම් කාර්යාලය
කොළඹ-10. ටැලි: 31332

# " අපේ කාලයේ දැනුම "

## 20 වන සියවසේ අපර භාගයේ තාක්ෂණික චින්තනය පිළිබඳ පොත් ප්‍රදර්ශණයක්

---

බදුල්ල බහුතාක්ෂණික ආයතනයේ

පුස්තකාලයාධිපති

ඩී. ජී. එස්. දොඩාවත්ත

විසිනි

බදුල්ල බහුතාක්ෂණික ආයතනයේ යෝජිත පුස්තකාලය ඇතුළු තෙමහල් ගොඩනැගිල්ලට මුල්ගල තැබීම අරභයා සංවිධාන කරන ලද උත්සව වැඩ සටහන් අතරට, මෙම ආයතනයේ පුස්තකාල කාර්ය මණ්ඩලය විසින් සංවිධාන කරන ලද පොත් ප්‍රදර්ශණයක්ද ඉදිරිපත් කළා. මෙම ප්‍රදර්ශණය 1978 ඔක්තෝබර් මස 29, 31 සහ නොවැම්බර් මස 01 යන දිනයන්හි මහජනයා සඳහා විවෘතව තිබුණා.

මෙම ප්‍රදර්ශණය නැරඹූ මහජනයාට සහ පාසල් සිසුන්ට පොත්පත් දැක බලාගෙන යාම පමණක් නොව, ඒවා පෙරළා පරීක්ෂා කර බැලීමටද ඉඩකඩ සලසා තිබුණා. ප්‍රදර්ශණය 10,000 කට අධික පිරිසක් විසින් නරඹනු ලැබුවා.

ප්‍රදර්ශණය පැවැත්වීමේ අරමුණු කීපයක් තිබුණා. ඉන් එකක් නම් ප්‍රදර්ශණ ය හැඳින්වීමට යොදා තිබුණු මාතෘකාව අනුව අදහසක් ඉදිරිපත් කිරීමයි. අපේ වත්මන් යුගයේ දැනුමත්, එම දැනුමේ ස්වභාවය පිළිබඳ ඉඟියක් දීමත් අපේක්ෂා කළා. උප ශීර්ෂයෙන් දක්වන පරිදි, 20 වන සියවසේ අපර යාමයේ - එනම් අප ජීවත් වන මෙම යුගයේ තාක්ෂණික චින්තනය පිළිබඳව මෙම යුගයේම ලියැවුණු පොත් ආශ්‍රයෙන් පාඨකයා තුළ විශේෂ අවබෝධයක් ඇති කිරීමද බලාපොරොත්තු වුනා. ඒ කවරාකාර චින්තන රූප සමූහයක්ද?

" අද අප ජීවත්වන සියවසේ අපරයාමයේ මිනිස් චින්තනයේ ඇති ක්‍රියාශීලී බව ප්‍රතිරූපණය කිරීම මෙම ප්‍රදර්ශණයේ මූලික අරමුණ වෙනවා. කයින් හා මනසින් මිනිසා දැනට නැවතී සිටින ස්ථානයට වඩා සුබදායක ලොවක් තැනීමට දැනුම නිපදවන අයුරු මෙම පොත් ප්‍රදර්ශණයෙන් පැහැදිලි විය යුතුයි..."

–(ප්‍රකාශන පත්‍රිකාවේ උපුටනයකි)

ප්‍රදර්ශණයේ මුල් කොටස වූයේ, නූතන යුගයේ පොතක් නිර්මාණය කිරීමට මිනිසා දක්වන කලාත්මක හා ශිල්පීය දක්ෂතාවයයි. අකුරු, වර්ණ, චිත්‍ර, ඡායාරූප, සංඛ්‍යා ලේඛන, කඩදාසිය මත මුද්‍රණය කිරීමේදී නූතන යුගයේදී පෙන්වා ඇති දක්ෂතාවීන් හා නිමාවේ සුන්දරත්වය පිළිබඳ උදාහරණ දක්වා තිබුණා.

එමෙන් පොත් කලාවේ ආරම්භය, ආගමික සාහිත්‍යය වැනි සීමිත විෂය ක්ෂේත්‍රයකට පමණක් සීමා වී තිබුණත්, අද මෙම පොත් කලාව තුළින් සාකච්ඡා නොකරන මාතෘකාවක්, විෂයක් නොමැති තරම් වෙයි. අකුරු තුළින් ඊයම් අකුරත්, මැටි පුවරුව තුළින් කඩදාසියත්, ලී අච්චුව තුළින් මුද්‍රණ යන්ත්‍රයත් බිහිවීමෙන් මානව ශිෂ්ඨාචාරය තුළ ඇති වූ අපූර්ව විපර්යාසය කවරේදැයි යන්න පෙන්වන්න සෑහෙන උත්සාහයක් දරා තිබුණා.

ප්‍රදර්ශණය තුළින් සෑම තාක්‍ෂණික විෂයක්ම සාකච්ඡා වෙන්න ඉඩ හැරියා.

ඉංජිනේරු විද්‍යාව ප්‍රමුඛ අවශේෂ විද්‍යාවන්, විද්‍යාත් ඉංජිනේරු විද්‍යාව හා ඉලෙක්ට්‍රෝනික ඉංජිනේරු විද්‍යාව, කාර්මික චිත්‍රකරණය හා සැලසුම් ශිල්පය, කම්හල් අභ්‍යාස, ලෝහ විද්‍යාව, මෝටර් යාන්ත්‍රික ඉංජිනේරු විද්‍යාව, වඩු කර්මාන්ත හා ගෘහ භාණ්ඩ නිෂ්පාදනය, ගොඩනැගිලි සැලසුම් හා ගොඩනැගිලි තැනීම, මැනුම් හා මට්ටම් ගැනීම, සනීපාරක්ෂක ඉංජිනේරු විද්‍යාව, නාගරික පරිපාලනය යන විෂයන්ද ඊට අනුයුක්ත වූ ගණිතය, භෞතික විද්‍යාව, රසායන ඉංජිනේරු විද්‍යාව, කෘෂිකර්මය හා ඊට අදාල ජීව විද්‍යාවන්ද, භූ විද්‍යාවද යන විෂයන්ගේ දැනුම් ක්ෂේත්‍රය මෙම යුගයේ කෙතරම් දුරට තවීකරණය වී ඇත්දැයි කෙනෙකුට අවබෝධයක් ලබා ගන්නට පුළුවන් වුනා. ව්‍යාපාර අධ්‍යයනය, ව්‍යාපාර පරිපාලනය, ගණකාධිකරණය, සංඛ්‍යානය, වාණිජ විද්‍යාව, දේශපාලන විද්‍යාව, ආර්ථික විද්‍යාව හා සමාජ විද්‍යාවද, තාක්‍ෂණික අධ්‍යාපනය සමග ඇති කරගෙන තිබෙන ඥාති සම්බන්ධතාවය හා එම විෂයන්ගේ නූතන

සංකල්පයන්ගේ කැපී පෙනෙන සුළු භාවයන් පෙන්වීමට මෙම පොත් එකතුව පොහොසත් වුනා.

කෘෂිකර්මය සඳහා නවතම මාදිලියේ වටිනා පොත් එකතුවක්ද ප්‍රදර්ශණය වුනා. එහි ඇතැම් පොත්වල වටිනාකම මුදලින් තක්සේරු කළොත් රු.200.00 - 350.00 අතර රැඳුනා.

අභ්‍යවකාශ යුගය පිළිබඳ පොත් එකතුවක්ද ප්‍රදර්ශණය කළා. වර්ණ චිත්‍ර සහිත එම විශේෂ එකතුව පාසල් සිසුන් තුළ විශාල කුතුහලයක් ඇති කළා.

ප්‍රදර්ශණය තුළ භාෂාවට ප්‍රමුඛත්වයක් හිමි වුනා. භාෂාවේ ඇති වැදගත්කම අසීමිත බව පෙන්වා තිබුණා. ජාතික භාෂා පමණක් නොව, විදේශ භාෂාවන් ඉගෙනීමේ ඇති අගය, නූතන තාක්‍ෂණික චින්තනය තුළ කා වැදී ඇති ප්‍රබල අදහසක් බව කියා පෑවා.

"අපේ කාලයේ සියළුම භාෂාවන් ශ්‍රේෂ්ඨය. අපේ තරුණ පෙළට සියළුම භාෂාවන් උසස්ය. ඔවුහු මහත් අභිරුචියකින් විදේශ භාෂා ඉගෙන ගනිති...."

(ප්‍රකාශන පත්‍රිකාවෙනි..)

1968 සිට 1978 වර්ෂය දක්වා වූ දශකය තුළ බදුල්ල බහුතාක්‍ෂණික ආයතනයේ පුස්තකාලයේ සාමාජික සංඛ්‍යාවේ වර්ධනය, පොත් තොගය හා වාර සඟරා එකතුවේ වර්ධනය, කියවීමේ වර්ධන වේගයක් සංඛ්‍යා ලේඛන ආශ්‍රයෙන් දැක්වූවා.

පුස්තකාලය, සියළුම දැනුම එකතු කිරීම, ඉන් දැනුම එකතු කිරීමේදී තාක්‍ෂණික අධ්‍යාපනයට ප්‍රමුඛත්වය දීම, එසේ එක් කළ දැනුම බෙදා හැරීමේ මාර්ග, තාක්‍ෂණික තොරතුරු ලබා ගැනීම හා බෙදා හැරීම, අනාගතයේදී පුළුල් වන සේවා පද්ධතිය පිළිබිඹු වන පෝස්ටර දැක්මක්ද මෙයටම එකතු කළා.

ප්‍රදර්ශණය සඳහා යොදා ගනු ලැබුවේ පුස්තකාල සම්පත් අතරට අළුතින් පිවිසුනු පොත් පමණයි. මින් වැඩි පොත් සංඛ්‍යාවක් සපයනු ලැබුවේ මහා බ්‍රිතාන්‍යයේ විදේශ සංවර්ධන දෙපාර්තමේන්තුව මගින්. එහි වටිනාකම ස්ටර්ලින් පවුම් 1000 (රු.30,000/=) වෙනවා. තවත් පොත් තොගයක් සැපයුවා ඇමෙරිකා එක්සත් ජනපදයේ ප්‍රජා සේවා ඒජන්සිය මගින්. එහි වටිනාකම ඩොලර් 200 (රු.3300/=) වෙනවා. සෙසු පොත් මිලදී ගත් ඒවා. ප්‍රදර්ශණය සංවිධාන කිරීමේදී ආයතනයේ සිසුන් විසින් දක්වන ලද උනන්දුව ඉහළින් අගය කළ යුතුයි.

ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය
සඳහා පොත් රැස් කිරීම

ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය සඳහා පොත් එකතු කිරීම ආරම්භ කළ බව සතුටින් නිවේදනය කරනු ලැබේ.

තෑගි වශයෙන් හෝ වෙනත් අයුරකින් ලංකාවේ භාෂා, ශාස්ත්‍ර, විද්‍යා, ඉතිහාස යනාදි විෂයයන්ට අදාළ පොත් පත් ලබා ගැනීමට ජාතික පුස්තකාල සේවා මණ්ඩලයට උපකාරී වන ලෙස ශාස්ත්‍රාභිලාෂී සියළු දෙනාගෙන්ම කරුණාවෙන් ඉල්ලා සිටිමි.

සභාපති
ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය.

තුන්වන මහල,
මාලිගාවත්ත මහලේකම් කාර්යාලය,
කොළඹ - 10.
දුරකථන අංකය : 36035
31332

## 1978 වර්ෂයේදී
## ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලයේ
## පුස්තකාල සේවා ප්‍රගතිය

1978 වර්ෂය තුළදී ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලයේ පුස්තකාල සේවා අංශය සහ පුස්තකාල අධ්‍යාපන අංශය මගින් ඉටු කරන ලද කාර්යයන් මෙහි පහත දැක්වේ.

### පොත් ප්‍රතිග්‍රහණය

1978 වර්ෂය සඳහා වෙන් කර ඇති වැය ශීර්ෂයන් යටතේ පුස්තකාල සේවා අංශය මගින් රුපියල් හැටනවදහස් තුන්සියඅසූඑකයි සත පනස්හතක් -(69,381/=57) වටිනා පොත් මිලදී ගන්නා ලදී.

බ්‍රිතාන්‍ය කවුන්සලය විසින් පුස්තකාල සේවා මණ්ඩලයට පිරිනමනු ලැබූ පවුම් 7,500 ක් වටිනා පොත් තොගය සඳහා පුස්තකාල විද්‍යාව, විද්‍යාව හා තාක්ෂණික පොත් ග්‍රන්ථ නාම 500 ක් පමණ පුස්තකාල සේවා පිළිබඳ සහකාර අධ්‍යක්ෂ විසින් තෝරා ගන්නා ලදුව එම පොත්ද ඇණවුම් කරන ලදී.

### මණ්ඩලයේ පොත් ආධාර වැඩ පිළිවෙල

1978 වර්ෂයේ පුස්තකාල සේවා මණ්ඩල පුස්තකාල සංවර්ධන වැඩ පිළිවෙල සඳහා තෝරා ගන්නා ලද පුස්තකාලවලින් බාහිරව, සභාපති තුමාගේ අනුමතිය ඇතිව පහත සඳහන් පුස්තකාලවලට පොත් ආධාර සැපයීම කර ඇත :

මහජන පුස්තකාල :

| | පුස්තකාලයේ නම | පිටපත් සංඛ්‍යාව | වටිනාකම |
|---|---|---|---|
| 01. | බිත්තැන්න දකුණ ගම්සභා ම/පු | 25 | 249.27 |
| 02. | මු/කිරඹ ගම්සභා ම/පු | 62 | 496. 4 |
| 03 | දිගාමඬුල්ල වීරගොඩ ගම්සභා ම/පු | 41 | 259.23 |
| 04 | බෙන්තොට සුළු නගරසභා ම/පු | 46 | 250.50 |
| 05 | කුකුළු කෝරළේ උඩපත්තු ගම්සභා ම/පු | 67 | 499.46 |

මණ්ඩලයේ පොත් ආධාර වැඩ පිළිවෙල....

| | | | |
|---|---|---|---|
| 06. | කුකුළු කෝරළේ මැදපත්තු ගම්සභා ම/පු | 62 | 498.43 |
| 07. | මහනුවර උඩබෝවල ම/පු | 44 | 245.16 |
| 08. | මහනුවර අම්පිටිය ම/පු | 27 | 252.13 |
| 09. | කුකුළු කෝරළේ පල්ලේපත්තු ගම්සභා ම/පු | 62 | 498.43 |
| 10. | දික්වැල්ල ම/පු | 58 | 499.69 |
| 11. | නුවරඑළිය ම/පු | 71 | 401.13 |
| 12. | ගන්දර ම/පු | 27 | 249.02 |
| 13. | මහනුවර කාර්යාලයට-(මහජන පුස්තකාල -සඳහා ආධාර දීමට) | 33 | 250.78 |
| 14. | වලස්මුල්ල ගම්සභා ම/පු | 35 | 248.68 |
| 15. | බත්තරමුල්ල ම/පු | 35 | 251.86 |
| | -මුළු එකතුව - | 695 | 5,150.71 |

පාසල් පුස්තකාල :
============

| | | | |
|---|---|---|---|
| 01. | පැරකුම්බා මහා විද්‍යාලය | 40 | 258.85 |
| 02. | රජඇල මහා විද්‍යාලය | 20 | 250.60 |
| 03. | කෝ/ආනන්ද බාලිකා මහා විද්‍යාලය | 25 | 247.25 |
| 04. | තුල්හිරිය මහා විද්‍යාලය | 119 | 1012.88 |
| 05. | ඇගැලියගොඩ මහා විද්‍යාලය | 19 | 244.79 |
| 06. | රත්නෝදය මහා විද්‍යාලය | 66 | 499.42 |
| 07. | රාහුල මහා විද්‍යාලය | 69 | 501.77 |
| 08. | සුමන මහා විද්‍යාලය | 71 | 499.79 |
| 09. | වත්තේගම මහා විද්‍යාලය | 24 | 252.41 |
| 10. | රාජසිංහ මහා විද්‍යාලය | 20 | 250.32 |
| 11. | කො/උරුවෙල මහා විද්‍යාලය | 66 | 263.92 |
| 12. | කෑ/බාබුල් හසන් මහා විද්‍යාලය | 58 | 310.58 |
| 13. | දඹුල්ල, ගලේවෙල මහා විද්‍යාලය | 82 | 499.91 |
| 14. | කොළ/කැරිකොටුව මහා විද්‍යාලය | 39 | 253.89 |
| | -මුළු එකතුව - | 718 | 5,346.38 |

වෙනත් පුස්තකාල :

| | | | |
|---|---|---|---|
| 01. | ජාතික පේෂකර්ම සංස්ථාව | 32 | 251.87 |
| 02. | ශ්‍රී ගාමිණී ප්‍රජා මණ්ඩලය | 47 | 249.35 |
| 03. | සමගිපුර ප්‍රජා මණ්ඩලය | 46 | 250.93 |
| 04. | ගල්ගමුව ප්‍රජා මණ්ඩලය | 36 | 257.19 |
| | | 161 | 1,009.34 |

මේ අනුව, ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලයේ වාර්ෂික පොත් ආධාර වැඩ පිළිවෙලින් බාහිරව මහජන, පාසල් හා වෙනත් පුස්තකාල සඳහා ප්‍රදානය කරන ලද සම්පූර්ණ පොත් පිටපත් සංඛ්‍යාව 1,574 ක් වන අතර, ඒවායේ වටිනාකම රුපියල් 11,506.43 ක් බව සඳහන් කළ යුතුවේ.

## පුස්තකාල උපකරණ ප්‍රදානය

පහත සඳහන් මහජන පුස්තකාල දහනවය (19) සඳහා එකක් රු.398.13 ක් බැගින් වටිනා පුස්තකාල උපකරණ කට්ටල ප්‍රදානය කරන ලද අතර, ඒවායේ මුළු වටිනාකම රුපියල් 7564.47 කි.

01. හැඳල සුළු නගර සභාව
02. මීගමුව මහ නගර සභාව
03. කටාන ගම්සභාව
04. කෙහෙල්ඇල්ල ගම්සභාව
05. මීරගම සුළු නගර සභාව
06. මිනුවන්ගොඩ ගම්සභාව
07. වේයන්ගොඩ සුළු නගර සභාව
08. ගම්පහ නගර සභාව
09. නාරන්විල ගම්සභාව
10. පූගොඩ ගම්සභාව
11. අලුගම සුළු නගර සභාව
12. ජා-ඇල නගර සභාව
13. අම්බලන්ගොඩ සුළු නගර සභාව
14. වලස්මුල්ල සුළු නගර සභාව
15. තංගල්ල නගර සභාව
16. වෙන්නප්පුව සුළු නගර සභාව
17. නාත්තන්ඩිය සුළු නගර සභාව
18. මාදම්පේ සුළු නගර සභාව
19. කල්පිටිය සුළු නගර සභාව

## ඒත්ප/ඊලි පොත් ආධාර වැඩ පිළිවෙල යටතේ
## ඉංග්‍රීසි පොත් ප්‍රදානය

1978 වර්ෂය තුළදී එක්සත් රාජධානියේ ඒත්ප/ඊලි පොත් ආධාර වැඩ පිළිවෙල යටතේ මෙරට විවිධ පුස්තකාල අතර බෙදා හැරීම සඳහා ලැබුණු ඉංග්‍රීසි පොත් තොගය විවිධ පුස්තකාල 32 ක් අතරත ප්‍රදානය කරන ලදී. මෙසේ ප්‍රදානය කරන ලද මුලු පොත් සංඛ්‍යාව පිටපත් 1735 කි.

දිවයින තුළ ඒත්ප/ඊලි පොත් ආධාර බෙදා හැරීමේ සම්පූර්ණ අයිතිය ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය සතු වන අතර, පොත් ආධාර ප්‍රදානයට සුදුසු පුස්තකාල තෝරා ගනු ලබන්නේ මණ්ඩලය වෙත ලැබෙන විවිධ පුස්තකාලවල ඉල්ලීම් පදනම් කරගෙනය.

ආධාර ප්‍රදානය කරන ලද පුස්තකාල ලේඛනය පහත දැක්වේ:

| | පුස්තකාලයේ නම | පොත් සංඛ්‍යාව |
|---|---|---|
| 01. | කොළ/මල්වාන ම.වි. | 50 |
| 02. | තර්ස්ටන් ම.වි. ව්‍යාපෘති සංගමය | 50 |
| 03. | ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩල සුභසාධක සංගමය | 50 |
| 04. | මිහින්තලේ කණිෂ්ඨ විද්‍යාලය | 50 |
| 05. | තුරයිතිලාවති ගම්සභා මහජන පුස්තකාලය | 50 |
| 06. | කෑ/දැ දිගම පැරකුම්බා ම.වි. | 50 |
| 07. | ත්‍රි/රජඇළ විද්‍යාලය | 50 |
| 08. | ජාතික පේෂ කර්ම සංස්ථා පුස්තකාලය, මින්නේරිය | 50 |
| 09. | බෝමිරිය ම.වි. කඩුවෙල | 50 |
| 10. | විද්‍යාරත්න පිරිවෙණ, හොරණ | 50 |
| 11. | මීගමුව මහ නගර සභා මහජන පුස්තකාලය | 50 |
| 12. | අල්හම්රා විද්‍යාලය, ධර්ගාටවුන් | 85 |
| 13. | ප්‍රීතිපුර ළමා නිවාසය, වත්තල | 100 |
| 14. | උඩපළාත ගඟපහල ගම්සභා මහජන පුස්තකාලය | 50 |
| 15. | තුල්හිරිය ම.වි. | 50 |
| 16. | ශ්‍රී රාමක්‍රිෂ්ණ සාරදා කාන්තා විද්‍යාලය, කොකුවිල් | 50 |
| 17. | කමු/ශ්‍රී ධම්මරතන සිංහල විද්‍යාලය, අක්කරපත්තුව | 50 |
| 18. | කඩුවෙල ගම්සභා මහජන පුස්තකාලය | 50 |
| 19. | සමගි සේවක පුස්තකාලය, රජයේ ගොඩනැගිලි දෙපාර්තමේන්තුව | 50 |
| 20. | මෝටර් ප්‍රවාහන කොමසාරිස්, සුභසාධක සංගමය | 50 |

## රත්පැරිලි පොත් ආධාර වැඩ පිළිවෙල...

| | | |
|---|---|---|
| 20. | මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් දෙපාර්තමේන්තුව, සු.සා.සං. | 50 |
| 21. | නව මහජන පුස්තකාලය, චැපල් පාර, නුගේගොඩ | 100 |
| 22. | කඳාන සුළු නගර සභා මහජන පුස්තකාලය | 50 |
| 23. | ගා/නෙළුව ගම්සභා මහජන පුස්තකාලය, | 50 |
| 24. | වතුගෙදර සුළු නගර සභා මහජන පුස්තකාලය | 50 |
| 25. | පිලැස්ස ගම්සභා මහජන පුස්තකාලය, මාවතගම | 50 |
| 26. | ලංකා පිඟන් සංස්ථා සේවක පුස්තකාලය, පිළියන්දල | 50 |
| 27. | සිරිමාවෝ බණ්ඩාරනායක විද්‍යාලය, කොළඹ | 50 |
| 28. | අස්ගිරි පල්ලෙසියපත්තු ගම්සභා මහජන පුස්තකාලය | 50 |
| 29. | පාලින්ද නුවර ගම්සභාව මහජන පුස්තකාලය, ලත්පඳුර | 50 |
| 30. | මහජන පුස්තකාලය, කුලියාපිටිය | 50 |
| 31. | මධ්‍ය මහා විද්‍යාලය, පිළියන්දල | 50 |
| 32. | මහජන පුස්තකාලය, හොරණ | 50 |
| | -මුළු පිටපත් සංඛ්‍යාව - | 1,735 |

### බ්‍රිතාන්‍ය කවුන්සලයෙන් පරිත්‍යාග කළ ඉංජිනේරු විද්‍යා පොත් ප්‍රදානය

දිවයිනේ විද්‍යා හා තාක්ෂණික පුස්තකාල අතර බෙදා හැරීම සඳහා බ්‍රිතාන්‍ය කවුන්සලයෙන් පරිත්‍යාග කරන ලද පොත් තොගය පහත සඳහන් විශේෂ පුස්තකාල අතර බෙදා හරින ලදී.

| | පුස්තකාලයේ නම | පොත් සංඛ්‍යාව |
|---|---|---|
| 01. | ශ්‍රී ලංකා දුරස්ථ අධ්‍යාපන ආයතනය | 25 |
| 02. | බහුතාක්ෂණික ආයතනය, බදුල්ල | 25 |
| 03. | බහුතාක්ෂණික ආයතනය, ගාල්ල | 25 |
| 04. | හාඩි පුහුණු ආයතනය, අම්පාර | 25 |
| 05. | බහුතාක්ෂණික ආයතනය, යාපනය | 25 |
| 06. | බහුතාක්ෂණික ආයතනය, මහනුවර | 25 |
| 07. | ලංකා කාර්මික විද්‍යාලය, මරදාන | 25 |

## පුස්තකාල පරීක්ෂණ හා උපදේශක සේවා

ගත වූ වර්ෂය තුළදී පහත සඳහන් විවිධ ගණයේ පුස්තකාල පණස් දෙකක් (52) ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලයේ පුස්තකාල සේවා පිළිබඳ සහකාර අධ්‍යක්ෂ එස්.එම්.කමල්දීන් මහතා විසින් සහ පරීක්ෂණ නිලධාරී වයි.හැරිසන් ද සිල්වා මහතා විසින් පුස්තකාල පරීක්ෂා කර, අවශ්‍ය වෘත්තීය උපදෙස් ලබා දීම කරන ලදී.

| දිනය | | පුස්තකාලයේ නාමය |
|---|---|---|
| 1978.01.24 | 01. | ධර්මපාල මහා විද්‍යාලය, පන්නිපිටිය |
| 1978.02.01 | 02. | මහජන පුස්තකාලය, අම්බලන්ගොඩ |
| | 03. | මහජන පුස්තකාලය, බෙන්තොට |
| | 04. | මහජන පුස්තකාලය, කළුතර |
| 1978.02.08 | 05. | සමාජ සේවා විද්‍යාලයීය පුස්තකාලය, කොළඹ 7. |
| | 06. | මියුසියස් විද්‍යාලය, කොළඹ |
| 1978.02.09 | 07. | ගොවි කටයුතු පර්යේෂණ හා අභ්‍යාස ආයතනයේ -පුස්තකාලය, කොළඹ 7. |
| 1978.03.09 | 08. | ගුරු අභ්‍යාස විද්‍යාලය, ධර්ගා නගරය, අළුත්ගම |
| 1978.04.20 | 09. | මහජන පුස්තකාලය, මාතර |
| 1978.06.09 | 10. | මහජන පුස්තකාලය, කල්මුණේ |
| 1078.06.13 | 11. | රාහුල ම.වි. දොඩම්පෙ, රත්නපුර |
| | 12. | ඇලෝෂියස් ම.වි. රත්නපුර |
| | 13. | සුමන ම.වි. රත්නපුර |
| | 14. | සමගිපුර ප්‍රජා මණ්ඩලය, රත්නපුර |
| **1978.06.26*** | 15. | මහජන පුස්තකාලය, කළුතර |
| | 16. | මහජන පුස්තකාලය, බෙන්තොට |
| | 17. | මහජන පුස්තකාලය, අම්බලන්ගොඩ |
| | 18. | මහජන පුස්තකාලය, හික්කඩුව |
| | 19. | මහජන පුස්තකාලය, බද්දේගම |
| | 20. | මහජන පුස්තකාලය, ගාල්ල |
| | 21. | මහජන පුස්තකාලය, පානදුර |
| | 22. | මහජන පුස්තකාලය, මොරටුව |

---

* 1978.06.26 වන දින පුස්තකාල පරීක්ෂණ කටයුතු සඳහා ඇමෙරිකානු පුස්තකාල පුස්තකාල උපදේශක ලියෝ හර්ලි මහතාද සහභාගී විය.

පුස්තකාල පරීක්ෂණ හා උපදේශක සේවා...

| | | |
|---|---|---|
| 1978.07.06 | 23. | තුල්හිරිය ම.වි. තුල්හිරිය |
| | 24. | මධ්‍ය මහා විද්‍යාලය, වේයන්ගොඩ |
| | 25. | මහජන පුස්තකාලය, වේයන්ගොඩ |
| 1978.07.24 | 26. | මහජන පුස්තකාලය, හපුතලේ |
| | 27. | හපුතලේගම මහජන පුස්තකාලය, දියතලාව |
| | 28. | කන්දපල්ල මහජන පුස්තකාලය, හල්දුම්මුල්ල |
| 1978.08.02 | 29. | පරමධම්ම බෞද්ධ ආයතන පුස්තකාලය, ගල්කිස්ස |
| 1978.09.11 | 30. | ඇහැලියගොඩ ම.වි. ඇහැලියගොඩ |
| | 31. | රාහුල ම.වි. රත්නපුර |
| | 32. | රත්නෝදය ම.වි. හංගමුව |
| | 33. | සුමන ම.වි. තිවිතිගල |
| | 34. | කුකුළු කෝරළේ ගම්සභා මහජන පුස්තකාලය, කලවාන |
| 1978.09.30 | 35. | චාවකච්චේරි මහජන පුස්තකාලය |
| 1978.10.04 | 36. | ශ්‍රී රාහුල ම.වි. මාලබේ |
| | 37. | දේවි බාලිකා විද්‍යාලය, කොළඹ 8 |
| 1978.10.10 | 38. | හංවැල්ල පේරුව මහජන පුස්තකාලය, හංවැල්ල |
| | 39. | රාජසිංහ මධ්‍ය මහා විද්‍යාලය, හංවැල්ල |
| 1978.10.11 | 40. | මහජන පුස්තකාලය, මහරගම |
| | 41. | විද්‍යාකර මහා විද්‍යාලය, මහරගම |
| | 42. | ආනන්ද මහා විද්‍යාලය, කොළඹ 10 |
| 1978.10.12 | 43. | මහජන පුස්තකාලය, මොරටුව |
| | 44. | වේල්ස් කුමාර විද්‍යාලය, මොරටුව |
| | 45. | මහජන පුස්තකාලය, දෙහිවල |
| 1978.10.25 | 46. | මහජන පුස්තකාලය, පිළියන්දල |
| | 47. | මධ්‍ය මහා විද්‍යාලය, පිළියන්දල |
| 1978.11.09 | 48. | මල්වත්ත ගම්සභාව, අම්පාර |
| 1978.11.15 | 49. | රාහුල ම.වි. අංගොඩ |
| | 50. | සුළු නගර සභාව, කොටිකාවත්ත |
| 1978.11.16 | 51. | ද ලාසල් ම.වි. කොළඹ |
| | 52. | මධ්‍ය මහා විද්‍යාලය, කොටහේන |

# වෘත්තීය හා තාක්ෂණික උපදෙස් දීම

මහජන පුස්තකාල, පාසල් පුස්තකාල, දෙපාර්තමේන්තු පුස්තකාල සහ වෙනත් පුස්තකාල සංවර්ධනයෙහිලා පුස්තකාල බලධාරීන් හට පුස්තකාල ගොඩනැගිලි, ලී බඩු හා උපකරණ සැලසුම් කිරීම, පුස්තකාල පිහිටුවීම, සංවිධානය හා ප්‍රතිසංවිධානය කිරීම, පොත් තොගය තෝරා ගැනීම සහ පවත්වාගෙන යාම, පුස්තකාල ශ්‍රේණිගත කිරීම යන කරුණු සම්බන්ධයෙන් විවිධ ගණයේ පුස්තකාල කට වෘත්තීමය හා තාක්ෂණික උපදෙස් ලබා දීමට පුස්තකාල සේවා මණ්ඩලය 1978 වර්ෂයෙහිදී සමත් විය.

එකී විවිධ කටයුතු සම්බන්ධයෙන් කටයුතු සලසන ලද පුස්තකාල ලේඛනය මෙහි පහත දැක්වේ:

## 1. පුස්තකාල ගොඩනැගිලි සැලසුම් කිරීම :

1. මාතර නගර සභා මහජන පුස්තකාලය
2. අම්බලන්ගොඩ නගර සභා මහජන පුස්තකාලය
3. චාවකච්චේරි නගර සභා මහජන පුස්තකාලය
4. කල්මුනේ සුළු නගර සභා මහජන පුස්තකාලය
5. හපුතලේ නගර සභා මහජන පුස්තකාලය
6. පරමධම්ම බෞද්ධ ආයතනය, රත්මලාන

## 2. පුස්තකාල උපකරණ හා ලී බඩු සැලසුම් :

1. වලස්මුල්ල සුළු නගර සභා මහජන පුස්තකාලය
2. ඌරුවල් පේරුව ගම්සභා මහජන පුස්තකාලය
3. උඩුනුවර මැද පළාත (උතුර) ගම්සභා මහජන පුස්තකාලය
4. වලව ගම්සභා මහජන පුස්තකාලය
5. අවිස්සාවේල්ල නගර සභා මහජන පුස්තකාලය
6. තවදුන් කෝරළේ පල්ලේ පත්තු ගම්සභා මහජන පුස්තකාලය
7. වාද්දුව වස්කඩුබද්ද ගම්සභා මහජන පුස්තකාලය
8. ශ්‍රාවස්ති පුර ගම්සභා මහජන පුස්තකාලය
9. ගලහිටියාව ගම්සභා මහජන පුස්තකාලය

2. පුස්තකාල උපකරණ හා ලිඛිත සැලසුම්....

10. හිඟුරාන ගම්සභා මහජන පුස්තකාලය
11. චාවකච්චේරි නගර සභා මහජන පුස්තකාලය
12. කල්මුනේ සුළු නගර සභා මහජන පුස්තකාලය
13. පින්දෙනිය ගම්සභා මහජන පුස්තකාලය
14. මාරම්බ ගම්සභා මහජන පුස්තකාලය
15. සියඹලාණ්ඩුව ගම්සභා මහජන පුස්තකාලය
16. කුරුන්වාකර්ති ගම්සභා මහජන පුස්තකාලය
17. අගලවත්ත ගම්සභා මහජන පුස්තකාලය
18. කොටවෙර ගම්සභා මහජන පුස්තකාලය
19. බින්තැන්න (දකුණ) ගම්සභා මහජන පුස්තකාලය
20. හරිශ්චන්ද්‍ර ම.වි. ගැමුණුපුර
21. එගොඩපත්තු ගම්සභාව
22. පිළියන්දල නගර සභාව
23. වේරගොඩ ගම්සභාව
24. බලන්ගොඩ නගර සභාව

3. පුස්තකාල පිහිටුවීම, සේවාවන් සංවිධානය කිරීම හා ප්‍රතිසංවිධානය කිරීම :

1. මාතර නගර සභා මහජන පුස්තකාලය
2. චාවකච්චේරි නගර සභා මහජන පුස්තකාලය
3. කල්මුනේ සුළු නගර සභා මහජන පුස්තකාලය
4. අම්බලන්ගොඩ නගර සභා මහජන පුස්තකාලය
5. බෙන්තොට සුළු නගර සභා මහජන පුස්තකාලය
6. බෙරලපනාතර ගම්සභා මහජන පුස්තකාලය
7. ඌරුවල්පේරුව ගම්සභා මහජන පුස්තකාලය
8. අවිස්සාවේල්ල නගර සභා මහජන පුස්තකාලය
9. පුත්ගුඩුතිව් ගම්සභා මහජන පුස්තකාලය
10. වෙන්නප්පුව පිරිමි විදුහල
11. මියුසියස් විදුහල, කොළඹ 7.
12. නවෝදය පුස්තකාලය, බලංගොඩ
13. ශ්‍රී ලංකා සමාජ සේවා විද්‍යාලයීය පුස්තකාලය
14. උසස් අධ්‍යාපන අමාත්‍යාංශයීය පුස්තකාලය

3. පුස්තකාල පිහිටුවීම, සේවාවන් සංවිධානය කිරීම හා ප්‍රතිසංවිධානය....

15. පුබුදු ළමා සමාජයීය පුස්තකාලය

4. පොත් තොගය තෝරා ගැනීම සහ පවත්වාගෙන යාම :

1. රඹුක්කන සුළු නගර සභා මහජන පුස්තකාලය
2. කැකිරාව සුළු නගර සභා මහජන පුස්තකාලය
3. චාවකච්චේරි නගර සභා මහජන පුස්තකාලය
4. ඌරුවල් පේරුව ගම්සභා මහජන පුස්තකාලය
5. වාකිරිගල ගම්සභා මහජන පුස්තකාලය
6. එගොඩපොත ගම්සභා මහජන පුස්තකාලය

5. පුස්තකාල ශ්‍රේණිගත කිරීම :

1. ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතන පුස්තකාලය
2. ශ්‍රී ලංකා පරිපාලන අභ්‍යාස ආයතන පුස්තකාලය

පාඨකයන්ගෙන් ඉල්ලීමක්...

"පුස්තකාල ප්‍රවෘත්ති" සඟරාවේ පළ කිරීම සඳහා සුදුසුදැයි සලකා බැලීම පිණිස ප්‍රවෘත්ති, ලිපි හා විශේෂාංග එවන ලෙස ආරාධනය කරනු ලැබේ.

අදාල ක්ෂේත්‍රයන් පිළිබඳ පොතපත, සඟරා, පත්‍රිකා විචාරය සඳහාද එවිය හැකිය. අවකාශ ඇති පරිද්දෙන් ඒවා පළ කෙරෙනු ඇත. පළ නොවන ලිපි ආපසු ගෙන්වා ගැනීම සඳහා ලිපිනය සහිත, මුද්දර ගැසූ ලියුම් කවරයක් එවනු මැනවි.

— සංස්කාරක

## පුස්තකාල වෘත්තීමය ප්‍රකාශන

### 1. මහජන පුස්තකාල තොරතුරු සංග්‍රහය

මහජන පුස්තකාල පිළිබඳ මෙම තොරතුරු සංග්‍රහය, ජාතික පුස්තකාල සේවා මණ්ඩලයේ පුස්තකාල සේවා අංශයේ ප්‍රකාශනයකි. මෙවැනි තොරතුරු සංග්‍රහයක් පිළියෙල කිරීමට පෙළඹ වූ ප්‍රධාන කරුණ වූයේ, දිවයිනේ ඇති පුස්තකාලයන්හි වර්තමාන තත්වය අවබෝධ කර ගැනීමය.

මහජන පුස්තකාල තොරතුරු සංග්‍රහය සකස් කිරීම පිණිස අවශ්‍ය තොරතුරු රැස් කිරීම අරඹන ලද්දේ 1977 වර්ෂයේ අවසාන කාර්තුවේය. මණ්ඩලය විසින් මෙම තොරතුරු රැස් කිරීම සඳහා ඒ ඒ පුස්තකාලවලට ප්‍රශ්නාවලියක් ඉදිරිපත් කරන ලදී.

මෙම තොරතුරු සංග්‍රහයේ සම්පාදක වශයෙන් කටයුතු කරන ලද්දේ පුස්තකාල සේවා කටයුතු පිළිබඳ සහකාර අධ්‍යක්ෂ එස්.එම්.කමල්දීන් මහතාය. එහි සහාය සම්පාදක වශයෙන් පුස්තකාල සේවා අංශයේ වයි.හැරිසන් ද සිල්වා මහතා කටයුතු කළේය.

සකස් කරන ලද මහජන පුස්තකාල තොරතුරු සංග්‍රහය පිටු 115 කින් යුක්ත වන අතර, එහි මහජන පුස්තකාල 462 ක තොරතුරු අඩංගු වේ.

### 2. මහජන පුස්තකාල ග්‍රන්ථාවලී

1978 ජනවාරි මාසය ඇතුළත මහජන පුස්තකාල සඳහා සුදුසු පොත් ඇතුළත් ග්‍රන්ථාවලියක් පිළියෙල කරන ලදී. මෙය ග්‍රන්ථ 200 කින් යුක්ත වූ අතර, 1976 - 77 වර්ෂයේ අළුත්ම පොත්වලින් යුක්ත විය. පොත් සඳහා නියමිත වර්ග අංකයන්ද යොදන ලදී.

### 3. පුස්තකාල ලී බඩු උපකරණ සැලසුම් ප්‍රකාශනය

මෙයට ප්‍රථම පැවති ලී බඩු උපකරණ ලැයිස්තු පොත සංශෝධනය කර, මෙම ප්‍රකාශනය සකස් කර ඇත. කලින් ප්‍රකාශනයේ නොමැති අළුත් උපකරණ ප්‍රමිති කිහිපයක් මෙහි ඇතුළත්ය.

මේ ප්‍රකාශනය ඉල්ලුම් කරනු ලබන පුස්තකාල සඳහා නොමිලයේ සැපයේ.

## පොත් හුවමාරු සේවාව

ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය මගින් පොත් හුවමාරු සේවාව ආරම්භ කරන ලද්දේ 1975 සැප්තැම්බර් මස 06 වන දින සිටය.

පුස්තකාල අතර පොත් පෙට්ටි හුවමාරුව සෑම තුන් මසකට වරක් සිදු කිරීම මෙහි මූලික කාර්යයයි.

1978 මුල් දෙමස තුළ පොත් හුවමාරු සේවාවේ අළුතින් මිලදී ගත් පොත් හැරුණු විට, භාවිතයේ පැවති පොත්වල (මීට පොත් පිටපත් 4359 ක් අයත්ය) ඇති යම් යම් අඩුපාඩුකම් නැවත සකස් කරන ලදී. මේ දෙමස තුළදී පමණක් නොව, සෑම වටයක් පාසා පොත් යවා අවසානයේදී පොත් තොගය පරීක්ෂා කර අඩුපාඩු සකස් කිරීම සිදු කරන ලදී.

පොත් හුවමාරු සේවාවේ 1977 වර්ෂයේ අවසාන වටයේ පොත් '78 මස 08 වන දින සිට එම මස 16 වන දින කාලය ඇතුළත එවන ලදී. එසේ එවන්නට යෙදුණ පහත සඳහන් පුස්තකාල 21 පරීක්ෂා කර, එහි ඇති අඩුපාඩුකම් බලා, ඒවායේ නොමැති පොත් සටහන් කර, එම පොත් නියමිත කොටස ලටට අයත් ස්ථානවල තබන ලදී.

| | පුස්තකාලයේ නම | පොත් ගණන |
|---|---|---|
| 01. | හික්කඩුව සුළු නගර සභාව | 47 |
| 02. | අක්මීමන ගම්සභාව | 48 |
| 03. | ගොළුවාමුල්ල - ඕමත්ත ගම්සභාව | 47 |
| 04. | හක්මන ගම්සභාව | 48 |
| 05. | උඩපළාත ගම්සභාව | 50 |
| 06. | උඩුගම ගම්සභාව | 45 |
| 07. | වෙල්ගම්පළාත ගම්සභාව | 48 |
| 08. | කළුතර බද්ද ගම්සභාව | 47 |
| 09. | චන්කානයි සුළු නගර සභාව | 50 |
| 10. | මත්තාරම සුළු නගර සභාව | 43 |
| 11. | ඕතර පළාත (උතුර) ගම්සභාව | 41 |
| 12. | අක්කරපත්තුව (දකුණ) ගම්සභාව | 44 |
| 13. | කාත්කාපල්ලිය ගම්සභාව | 50 |
| 14. | මුත්තූර් සුළු නගර සභාව | 50 |
| 15. | මඩකලපුව මහ නගර සභාව | 48 |

පොත් හුවමාරු සේවාව....

| | | |
|---|---|---|
| 16. | මතුගම සුළු නගර සභාව | 50 |
| 17. | කෝට්ටේ නගර සභාව | 48 |
| 18. | තිස්සමහාරාම සුළු නගර සභාව | 45 |
| 19. | කත්කසන්තුරේ සුළු නගර සභාව | 46 |
| 20. | හලාවත නගර සභාව | 41 |
| 21. | කිලිනොච්චි සුළු නගර සභාව | 47 |

පොත් හුවමාරු සේවාවේ සාමාජික පුස්තකාල විසින් එවන ලද ලැයිස්තු අනුව, ඔවුනට අයත් නියමිත කොටස්වලින් පොත් තෝරා ට්‍රන්ක පෙට්ටිවල බහා පහත සඳහන් පුස්තකාලවලට දුම්රිය මගින් යවන ලදී. මෙහිදී පොත් හුවමාරු සේවාවේ පොත් නිකුත් කිරීමේ ක්‍රමය අනුගමනය කරන ලදී.

| | පුස්තකාලයේ නම | පොත් ප්‍රමාණය |
|---|---|---|
| 01. | හික්කඩුව සුළු නගර සභාව | 50 |
| 02. | අක්මීමණ ගම්සභාව | 50 |
| 03. | චුන්නාකම් සුළු නගර සභාව | 50 |
| 04. | ගොළුවාමුල්ල - ඕමත්ත ගම්සභාව | 50 |
| 05. | හක්මන ගම්සභාව | 50 |
| 06. | උඩපළාත ගම්සභාව | 50 |
| 07. | උඩුගම ගම්සභාව | 50 |
| 08. | වෙල්ගම් පළාත ගම්සභාව | 50 |
| 09. | කළුතර බද්ද ගම්සභාව | 50 |
| 10. | චන්කානෙයි සුළු නගර සභව | 50 |
| 11. | මන්නාරම සුළු නගර සභාව | 50 |
| 12. | කාත්තාපල්ලිය ගම්සභාව | 50 |
| 13. | මුත්තූර් සුළු නගර සභාව | 50 |
| 14. | මඩකලපුව මහ නගර සභාව | 50 |
| 15. | මතුගම සුළු නගර සභාව | 50 |
| 16. | කෝට්ටේ නගර සභාව | 50 |
| 17. | කත්කසන්තුරේ සුළු නගර සභාව | 50 |

## පුස්තකාල අධ්‍යාපන හා පුහුණු වැඩ පිළිවෙල

පුස්තකාල අධ්‍යාපන හා පුහුණු වැඩ පිළිවෙල යටතේ මණ්ඩලය විසින් මෙහෙයවනු ලබන පුස්තකාල අධ්‍යාපන හා සේවාස්ථ පුහුණු වැඩ පිළිවෙල යටතේ පහත සඳහන් **පුස්තකාල නිලධාරීන්ට පුහුණුවක් ලබා දෙන ලදී:**

(අ) මහජන පුස්තකාලයාධිපතීන්

(ආ) ගුරු පුස්තකාලයාධිපතීන්

(ඇ) වෙනත් අංශවලට අයත් වූවන්

(ඈ) පුස්තකාලයාධිපතීන් සඳහා සේවාස්ථ පුහුණුව

### මහජන පුස්තකාලයාධිපතීන් පුහුණු කිරීම :

ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය විසින් 1978.01.01 දින සිට 1978.12.31 වන දින දක්වා වූ කාල පරිච්ඡේදය තුළදී මහජන පුස්තකාලයාධිපතීන් පුහුණු කරලීමේ අභ්‍යාස පාඨ මාලා හතක් (07) පවත්වන ලදී. මෙම පාඨ මාලා සියල්ලම සිංහල මාධ්‍යයෙන් පැවැත්විනි.

මෙයින් පාඨ මාලා හතරක් උසස් මට්ටමේ දින තුනක පාඨ මාලා වූ අතර, ඉතිරි තුන දින පහක ප්‍රාථමික මට්ටමේ හැඳින්වීමේ පාඨමාලා විය. මෙම පාඨමාලා සඳහා සහභාගී වී පුහුණුව ලැබූ මහජන පුස්තකාලයාධිපතීන්ගේ සංඛ්‍යාව එකසිය හැට හයකි.

මෙම පාඨමාලා මගින් නුපුහුණු පුස්තකාලයාධිපතීන් සඳහා පුස්තකාල සේවා සංවිධානය සහ පරිපාලනය පිළිබඳව මූලික අවබෝධයක් ලබා දෙන ලදී.

පාඨමාලාවන්හි දේශන පැවැත්වීම සහ ප්‍රායෝගික කටයුතු සඳහා දේශකයින් දෙදෙනකුගේ සිට සත් දෙනෙකු දක්වා වූ සංඛ්‍යාවක් එක් පන්තියක් සඳහා සහභාගී විය.

මෙම පාඨමාලා පැවැත්වීමේදී පළාත් පාලන අභ්‍යාස හා පර්යේෂණ ආයතනයේ සහාය පුස්තකාල සේවා මණ්ඩලයට නොඅඩුව ලැබුණු බව සඳහන් කළ යුත්තකි.

1978 ජනවාරි මස සිට දෙසැම්බර් මස දක්වා

මහජන පුස්තකාලයාධිපතීන් සඳහා පවත්වන ලද

පාඨ මාලා සවිස්තරව

| කාලය | | පාඨ මාලා ස්වභාවය | සහභාගි වූ සංඛ්‍යාව | ස්ථානය |
|---|---|---|---|---|
| 1. | 1978.02.13 - 17 | ප්‍රාථමික මට්ටම | 27 | පළාත් පාලන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය කොළඹ 7 |
| 2. | 1978.03.20 - 22 | උසස් මට්ටම | 26 | - එම - |
| 3. | 1978.04.24 - 26 | ප්‍රාථමික | 27 | - එම - |
| 4. | 1978.05.24 - 26 | උසස් | 22 | - එම - |
| 5. | 1978.07.05 - 07 | උසස් | 22 | - එම - |
| 6. | 1978.09.13 - 15 | උසස් | 24 | - එම - |
| 7. | 1978.10.23 - 27 | ප්‍රාථමික | 18 | - එම - |
| 8. | 1978.11.01 - 03 | උසස් | 19 | - එම - |
| 9. | 1978.11.20 - 24 | ප්‍රාථමික | 20 | - එම - |

මෙම අභ්‍යාසලාභීන් සියලු දෙනාටම කොළඹ නගරයේ ඇති පහත සඳහන් වැදගත් පුස්තකාල සියල්ල නැරඹීමට අවස්ථාවක් සලසා දෙන ලදී. මේ මගින් ඔවුනට විවිධ පුස්තකාලයන්හි සංවිධානය හා පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගැනීමට හැකි විය. එම පුස්තකාල මේවාය :

1. ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලය - කොළඹ මණ්ඩප පුස්තකාලය
2. මහජන පුස්තකාලය, කොළඹ
3. අමෙරිකානු මධ්‍යස්ථාන පුස්තකාලය
4. ශ්‍රී ලංකා ජාතික විද්‍යා සභා පුස්තකාලය
5. ලංකා විද්‍යාත්මක හා පර්යේෂණ ආයතන පුස්තකාලය

## ගුරු පුස්තකාලයාධිපතීන් පුහුණු කිරීම :

ගුරු පුස්තකාලයාධිපතීන් සඳහා පාඨ මාලා සංවිධානය කරන ලද බවද, ඒ සඳහා සහාය වන මෙන්ද, අධ්‍යාපන අමාත්‍යාංශයේ පාසල් සංවිධාන ශාඛාව මගින් ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය වෙත ඉල්වීමක් කරන ලදී.

ඒ අනුව පුස්තකාල සේවා මණ්ඩලයේ සහාය ඇතිව පහත සඳහන් පාඨමාලා 1978.01.01 වන දින සිට 1978.10.31 වන දින දක්වා වූ කාලය තුළදී පවත්වන ලදී.

මෙම පාඨ මාලා සියල්ල සිංහල මාධ්‍යයෙන් පවත්වන ලදී.

### ගුරු පුස්තකාලයාධිපතීන් සඳහා පැවති පාඨ මාලා සවිස්තරව

| කාලය | පාඨ මාලා ස්වභාවය | සහභාගි වූ සංඛ්‍යාව | ස්ථානය |
|---|---|---|---|
| 1. 1978.03.27 - 31 | උසස් | 92 | තිට්ටඹුව ගුරු විදුහල |
| 2. 1978.08.08 - 12 | උසස් | 150-(ආසන්න) | මීරිගම ගුරු විදුහල |
| 3. 1978.08.15 - 20 | උසස් | 150-(-එම-) | පේරාදෙණි ගුරු විදුහල |

මෙම පාඨ මාලා සඳහා සහභාගී වී පුහුණුව ලැබූ ගුරු පුස්තකාලයාධිපතීන්ගේ සංඛ්‍යාව තුන්සිය අනුදෙකකි. මෙමගින් නුපුහුණු ගුරු පුස්තකාලයාධිපතීන් සඳහා පුස්තකාල සේවා සංවිධානය හා පරිපාලනය පිළිබඳව මූලික අවබෝධයක් ලබා දෙන ලදී.

පාඨ මාලාවන්හි දේශන පැවැත්වීම සඳහා සහ ප්‍රායෝගික කටයුතු සඳහා දේශකයින් දෙදෙනකුගේ සිට නව දෙනෙකු දක්වා වූ සංඛ්‍යාවක් එක් පන්තියක් සඳහා සහභාගි විය.

මෙම පාඨ මාලා පැවැත්වීමේදී අධ්‍යාපන අමාත්‍යාංශයේ පාසල් සංවිධාන ශාඛාවේ සහාය නොඅඩුව ලැබුණු බව සඳහන් කළ යුතු කරුණකි.

## වෙනත් අංශවලට අයත් වුවන්ට පුස්තකාල පුහුණුව :

මෙම වැඩ පිළිවෙල යටතේ පුස්තකාල සේවා මණ්ඩලය විසින් ප්‍රජා මණ්ඩල නිලධාරීන් සඳහා රත්නපුර නගර සභා ශාලාවේදී එක් දින සම්මන්ත්‍රණයක් 1978 පෙබරවාරි මස 28 වන දින පවත්වන ලදී.

මෙම සම්මන්ත්‍රණය සඳහා ප්‍රජා මණ්ඩල නිලධාරීන් පණහක් (50) සහභාගී වූ අතර, දේශන සිංහල මාධ්‍යයෙන් පවත්වන ලදී.

මීට සහභාගි වූවන් අතර, පුස්තකාල සේවා මණ්ඩලයේ සභාපති , අධ්‍යක්‍ෂ , පුස්තකාල අධ්‍යාපනය පිළිබඳ සහකාර අධ්‍යක්‍ෂ හා කොළඹ මහජන පුස්තකාලයේ නියෝජ්‍ය පුස්තකාලයාධිපතිද වූහ.

## පුස්තකාලයාධිපතීන් සඳහා සේවාස්ථ පුහුණුව :

පසුගිය වර්ෂයේ ගත වූ කාල පරිච්ඡේදය තුළදී පුස්තකාලයන්හි සේවය කරන සිව් දෙනෙකු හට සේවාස්ථ පුහුණුව ලබා දීමට පුස්තකාල සේවා මණ්ඩලය සමත් විය.

මොවුන් අතර, ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ සංවර්ධන මණ්ඩලයේ පුස්තකාලයාධිපති සහ ජනාවාස කොමිෂන් සභාවේ පුස්තකාල කටයුතු පිළිබඳ විෂය භාර නිලධාරී යන දෙදෙනාට කොළඹ මහජන පුස්තකාලයේදී 1978 ජනවාරි මස 16 වන දින සිට සති දෙකක කාල පරිච්ඡේදයක පුහුණුව ලබා දෙන ලදී.

අළුත්ගම, ධර්ගා නගරයේ ගුරු විද්‍යාලයීය පුස්තකාලයේ සේවය කරන පුස්තකාල සේවිකාව හට කළුතර මහජන පුස්තකාලයේදී 1978 ජූලි මස 16 වන දින සිට සති දෙකක කාලයක පුහුණුවක්ද, කොටහේන, රජයේ සිංහල මිශ්‍ර කනිෂ්ඨ විද්‍යාලයේ සේවය කරන පුස්තකාල සේවිකාව හට දෙහිවල, මහජන පුස්තකාලයේදී 1978 ඔක්තෝබර් මස 09 වන දින සිට සති දෙකක සේවාස්ථ පුහුණුවක්ද ලබා දීමට පුස්තකාල සේවා මණ්ඩලය විසින් කටයුතු යොදන ලදී.

(1978 වර්ෂය තුළදී ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලයේ පුස්තකාල සේවා අංශය සහ පුස්තකාල අධ්‍යාපන සහ අභ්‍යාස අංශය මගින් ඉටු කරනු ලැබූ වැඩ කටයුතු පිළිබඳ වාර්තාව ඇසුරෙන් සකස් කරන ලදී.)

## ප්‍ර කා ශ න

ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය මගින්
ප්‍රකාශිත පොතපත...

* <u>මහජන පුස්තකාල ප්‍රමිති</u>

  සංස්කරණය:
  ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය
  මිල රු: 4.00

* <u>ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ නාමාවලිය</u>

  වාර්ෂික දායක මුදල රු: 45.00 (තැ.ගා.සමග)

* <u>මහජන පුස්තකාල තොරතුරු සංග්‍රහය - 1978</u>

  මිල රු: 10.00

* <u>පුස්තකාල ප්‍රවෘත්ති</u>

  සිංහල - දෙමළ - ඉංග්‍රීසි භාෂා ත්‍රයෙන්
  ත්‍රෛමාසික ප්‍රකාශනය - නොමිළයේ සැපයේ

* Catalogue of Postgraduate Dissertations in the Libraries of Sri Lanka - /‾2nd ed. in press_7
  Comp. by N. Amarasinghe (Unpriced)

ලියුම්, මුදල් ඇණවුම් හෝ චෙක්පත් පහත ලිපිනයට:

අධ්‍යක්ෂ, ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය,
තුන්වන මහල, මාලිගාවත්ත මහලේකම් කාර්යාලය, කොළඹ- 10.
ටැලි: 31332

# ග්‍ර න් ථ කෝ ෂ

එන්. අමරසිංහ
විසිනි

ග්‍රන්ථ නිෂ්පාදනය ඉතා බහුලවීමත් ශාස්ත්‍රය මහජන වරප්‍රසාදයක් වීමත් අන්‍යොන්‍ය සම්බන්ධතාවයකින් යුතුව හේතුඵල වශයෙන් ඇති වූ ධර්මතාවයකි. සමාජයේ රජ ඇමති හෝ කුලීන හෝ පණ්ඩිත යනුවෙන් කීප දෙනෙකුට සීමාව තිබූ ශාස්ත්‍රය ඒ කඩඉම් ඉක්මවූයේ නූතන ක්‍රමවලට පොත්පත් සකස් කිරීම ආරම්භවීමෙන් පසුය. සීමිත ශිෂ්‍යානුශිෂ්‍ය පරම්පරාවකට ශාස්ත්‍රය රඳවා ගත හැකි වූයේ, 'ගුරු මුෂ්ටිය' මෙන්ම, ශාස්ත්‍රය ග්‍රන්ථාරූඪ කරන ලද්දේද සීමිත සංඛ්‍යාවක් හෙයිනි. මෙසේ හෙයින් යම්කිසි ශාස්ත්‍රයක් සම්බන්ධ යම්කිසි ග්‍රන්ථ වූයේ නම් ඒවා පිළිබඳ දැනුම ඔවුහු අනවරතයෙන්ම දැන සිටියහ. එවැනි ග්‍රන්ථ වූයේද අතලොස්සකි.

නූතන ලෝකයේ හදාරනු ලබන ශාස්ත්‍රයන්ගෙන් කිසිම විෂයයක් සම්බන්ධයෙන් ඒ විෂයය සම්බන්ධ ලියැවී ඇති පොත්පත් සියල්ල පසෙක තබා, ඉතා වැදගත් පොත්පත්වත් මොනවාද යන්න සඳහන් කිරීමට කෙනෙකු සමත් නොවේ. එතරම් පොත්පත් ලිපි ලේඛන ඒ ඒ විෂයයන් සම්බන්ධයෙන් ලියැවෙන හෙයිනි.

ග්‍රන්ථ කෝෂ බිහි වන්නට වූයේ මෙතැනදීය. ග්‍රන්ථ කෝෂයකින් බලාපොරොත්තු වන්නේ යටකී පරිදි, එක් විෂයයක් අළලා හෝ විෂයයන් කීපයක් සම්බන්ධයෙන් හෝ සාමූහික වශයෙන් ඕනෑම දෙයක් සම්බන්ධයෙන් හෝ ලියැවී ප්‍රසිද්ධ වන පොත්පත් මොනවාද යන්න පොතපත කියවන මහජනයාට දැනුම් දීමයි. අණිතින් බිහිවෙන පොතපත ගැන මහජනයාත්, ශාස්ත්‍රය හදාරන්නවුනුත් දැන ගත යුත්තේ ඇයි? සෑම ග්‍රන්ථයක්ම මානුෂික කාල්පනික ශක්තියෙන් ජනිත වන නිර්මාණයක් ලෙස සලකනහොත්, ඒ කෘතිය විද්‍යානුකූල වේවා, කලාත්මක වේවා, එයින් එනෙක් සමාජයේ නුවූ වැඩීමක් හෝ වෙනස්වීමක් හෝ දියුණුවක් ඇතිවීමට හේතු වන බව පැහැදිලිය.

ජාතික ග්‍රන්ථ නාමාවලි

ජාතික ග්‍රන්ථ නාමාවලියක් යනු කුමක්ද? වාච්‍ය අර්ථයෙන් හැඟෙන පරිදි, එය යම්කිසි රටක බිහිවෙන දර්ශන, විද්‍යා, සාහිත්‍යාදී අනේක විධ විෂය අළලා රචනා කොට ප්‍රසිද්ධ කරන ලද පොත්පත්වල ලේඛනයකි. මේ අනුව, ජාතික ග්‍රන්ථ නාමාවලියක් ජාතියකගේ සම්පූර්ණ සාහිත්‍ය පිළිබඳ ඉතිහාසයකි. ඊට මුද්‍රණාද්වාරයෙන් බිහිවෙන පොත්පත් පමණක් නොව, පොත්පත් මුද්‍රණයට පෙරාතුව පැවති ලේඛන ක්‍රම වලින් නිපැද වූ පුස්තකාල පොත්, තඹපත්, රන්පත් ආදී ලෝහමය පත්‍ර ග්‍රන්ථද වෙනත් ද්‍රව්‍යවල ලියැවී ඇති ලේඛනද යන සියල්ල ඇතුළත් විය යුතුය. එසේම එය එක් වකවානුවකට සීමිත වන්නක් නොව, සාහිත්‍ය කෘති නිපැයීම ආරම්භ වූදා පටන් අද දක්වාත්, අනාගතයේදී ඇතිවෙන ග්‍රන්ථ පිළිබඳවත් ලියැවෙන අඛණ්ඩ ලේඛනයකි. වචනයේ පරිසමාප්ත්‍යාර්ථයෙන් ගත් කල, ජාතික ග්‍රන්ථ නාමාවලිය ශිෂ්ටාචාරය පවතිනා තාක් ගොඩ නැගෙන මහාර්ඝ ග්‍රන්ථ ඉතිහාසයකි.

සාමාන්‍යයෙන් අදහස් ප්‍රකාශ කිරීමේ සහ ප්‍රචාරය කිරීමේ ප්‍රධාන මාර්ගය වශයෙන් පොත්පත් පාවිච්චි කරන නමුදු, නූතන විද්‍යාත්මක දියුණුව නිසා අද වෙනස් මාධ්‍යයන් මගින් මේ කර්තව්‍යය සිද්ධ වේ. ඇතැම් රටවල පොත්පත් පාවිච්චි කරනු ලබන්නේ එක්තරා විශේෂ විධියේ ශාස්ත්‍ර ඥානය පතුරුවාලීම සඳහා පමණය. තරමක් උගත් අය සඳහා පොතපත සාමාන්‍යයෙන් පරිහරණය කරන නමුත්, නූගත් අයට උගැන්වීම සඳහා අද වඩාත් යොදා ගනු ලබන්නේ 'ශ්‍රව්‍ය – දෘෂ්‍ය' (Audio-Visual) මාධ්‍ය වේ.; එය උගතුනට වුවද එක එල්ලේ තොරතුරු ලබා දිය හැකි ප්‍රබල මාධ්‍යයකි.

ශාස්ත්‍ර ව්‍යාප්තිය සඳහා ඉතා සාර්ථක ප්‍රතිඵල ලබාදෙන මාධ්‍යයකි චිත්‍රපටය. මේ කර්තව්‍යය සඳහා යුරෝපයේ හා බටහිර රටවල ගුවන් විදුලිය හා රූපවාහිනිය ඉතා පෘථුල ලෙස යොදා ගනු ලැබේ. මේ රටවල පොත් කියවන සංඛ්‍යාවත්, ගුවන් විදුලිය, රූප වාහිනිය හා චිත්‍රපටය මාර්ගයෙන් දැනුම ලබා ගන්නා පිරිසත් පිළිබඳ පරීක්ෂණ වලින් හෙළි වී ඇත්තේ ශාස්ත්‍ර ව්‍යාප්ති මාධ්‍යයක් වශයෙන් පොතපතට අද ලැබෙන තැන කලකට පෙරාතුව ඊට ලැබුණු තැනට වඩා වෙනස් බවය. දැනුම

... අරහයා පොතපත කියවන්නෝ කලින් සඳහන් කළාක් මෙන් එක්තරා උගත් කොට්ඨාශයක් පමණය. සාමාන්‍ය ජනයා ප්‍රිය කරන්නේ පොතපතට වඩා වෙනත් මාධ්‍යයන්වලය. මේ හේතුව නිසා පොතපතට අතිරේක වූ මේ මාධ්‍යයන් වඩ වඩා ශාස්ත්‍රීය ව්‍යාප්ති කටයුතු සඳහා යොදා ගැනීමෙන් පෙර ශාස්ත්‍ර කෝෂ්ඨාගාර වශයෙන් හැඳින් වූ පුස්තකාල අද හුදෙක් 'පුස්තක – ආලයන්' පමණක් නොව, චිත්‍රපට කෝෂ්ඨාගාර, ශබ්ද පට කෝෂ්ඨාගාර, රූපවාහිනී හා ශබ්ද තැටි යනාදියද තැන්පත් කෙරෙන සම්පත් භාණ්ඩාගාර බවට පරිවර්තනය වී තිබේ.

මෙහි ප්‍රතිඵලය වනුයේ පුස්තකාලයන්වල වඩ වඩා මෙකී ද්‍රව්‍ය තැන්පත්වීමය. එහෙයින් මේ ද්‍රව්‍ය ගැන තොරතුරු ව්‍යාප්ත කිරීමද අවශ්‍ය ව තිබේ.

ජාතික ග්‍රන්ථ නාමාවලියක යටතේ ද්‍රව්‍ය පිළිබඳ විස්තර අඩංගු විය යුත්තේ මේ හෙයිනි. බොහෝ රටවල කෙරෙනුයේ නාමාවලියේ විශාලත්වය මඟ හරිනු වස් ඒවා පිළිබඳ අතිරේක නාමාවලි සකස් කිරීමය. ශ්‍රී ලංකාව වැනි රටක මේ පිළිබඳ තොරතුරු කෙතරම් දුර්ලභද යත්න ලංකාවේ චිත්‍රපට ඉතිහාසය වැනි විෂයයක් සම්බන්ධ පර්යේෂණ කිරීමට ආරම්භ කළහොත් වැටහෙනවා ඇත. ඒවා ගැන සෑහෙන තොරතුරක්ද සොයා ගැනීමට මාධ්‍යයක් තවම සකස් වී නැත්තේය.

## ඉතිහාසය

ග්‍රන්ථ කෝෂ ගොඩ නැඟීම ශාස්ත්‍රෝත්පත්තිය ඇති වූ බොහෝ අවස්ථාවල බොහෝ රටවල ආරම්භ කරන ලදී. විශේෂයෙන් යුරෝපයේ ක්‍රිස්තු වර්ෂය ආරම්භ වී වැඩි කලක් නොගොසින් එවැන්නක් ගොඩ නැඟීමට උත්සාහ ගත් බවට සාක්ෂි ඇත. ලෝකයේ ප්‍රථම ජාතික ග්‍රන්ථ නාමාවලිය පටන් ගන්නා ලද්දේ ග්‍රීක හා රෝම සභ්‍යත්වයන් යටතේ ගොඩ නැගුනු ඇලෙක්සැන්ඩ්‍රියානු මහා පුස්තකාලයේදීය. ජාතික ග්‍රන්ථ නාමාවලිය සකස් කරන ලද ග්‍රන්ථ කෝෂ විද්‍යායතනය 'Bibliographic Centro ' මෙම පුස්තකාලයේ ශාඛාංශයක් ලෙස ක්‍රියා කරන ලදී. ඇලෙක්සැන්ඩ්‍රියානු පුස්තකාලය එකල ශාස්ත්‍රීය ලෝකයේ මුදුන් මල්කඩ ලෙස ජාත්‍යන්තර කීර්තියට පත් වූ විද්‍යායතනයකි.

එහි එදා විද්වත් ලෝකයේ වූ ග්‍රන්ථවලින් එක පිටපත බැගින්වත් තැන්පත් වී තිබීතැයි සලකනු ලැබේ. ග්‍රීක, ලතින්, හීබෲ පමණක් නොව, වෙනත් භාෂාවලින් පරිවර්තනය කරන ලද ග්‍රන්ථද මෙහි තැන්පත් කොට තිබිණ. පරිවර්තන අතර බෞද්ධ ග්‍රන්ථද, පරිවර්තනයක් සකස් කිරීම හා පිටපත් කිරීම සඳහා බෞද්ධ භික්ෂූන් වහන්සේලාද යොදවා සිටි බව අනාවරණය වී තිබේ. එකල ලෝකයේ නා නා රටවලින් පැමිණි විද්වත්හු මෙම මහා පුස්තකාලයේ නානා නා විෂයයන් පිළිබඳව පර්යේෂණ කළහ. ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ විසින්ද මෙම පුස්තකාලය පාවිච්චි කළ බව කියවේ. යුදෙව් ජාතිකයන්ට දම් දෙසීම සඳහා උන් වහන්සේ විසින් මෙම පුස්තකාලයෙහි වූ හීබෲ භාෂාවෙන් පරිවර්තනය කරන ලද පරණ තෙස්තමේන්තුව හැදෑරූ බව සඳහන් වේ. මොවුන්ගේ පර්යේෂණයන්ට ඉතා උපකාරී වූයේ මෙම පුස්තකාලයේ සකස් කරනු ලැබූ යටකී ජාතික ග්‍රන්ථ නාමාවලියයි.

ඇලෙක්සැන්ඩ්‍රියානු ජාතික ග්‍රන්ථ නාමාවලියේ පිටපතක් අද සොයා ගැනීමට නොහැකිවීම අභාග්‍යයකි. එහෙත් එහි ඇතැම් කොටස්, එහි පළ වූ වෙනත් ශාස්ත්‍රීය ග්‍රන්ථයන්හි උපුටා දැක්වීමෙන් මෙම නාමාවලියේ ස්වභාවය ගැන තරමක අවබෝධයක් ලබා ගත හැක. 'පිනැක්ස්' නමින් හැඳින් වූ මෙම නාමාවලිය සකස් කොට තිබුණේ ජේව - ග්‍රන්ථ - විද්‍යානුකූල විස්තරවලින් යුක්තව කාල ක්‍රමානුගතවය.

කර්තෘවරුන්ගේ හා ඔවුනගේ ග්‍රන්ථ ගැනද විස්තර මෙහි සඳහන් විය. ඒ ඒ කර්තෘවරුන්ගේ නම් සඳහන් වූයේ ඔවුනොවුන් උපන් වර්ෂයන් අනුවය. අද ඇතැම් රටවල නිෂ්පාදනය කරන ජාතික ග්‍රන්ථ නාමාවලිවලටත් වඩා ඇතැම් උසස් ලක්ෂණ මේ ග්‍රන්ථ නාමාවලියෙහි තිබූ බව මේ තොරතුරුවලින් ප්‍රත්‍යක්ෂ වේ.

<u>නූතන අවශ්‍යතා</u>

පුරාතනයෙහි ශාස්ත්‍රීය ලෝකයේ ඇති වූ අවශ්‍යතාවයනට වඩා වෙනස් විදිහේ අවශ්‍යතාවයන් අද ශාස්ත්‍රීය ලෝකයට ඇති වී තිබේ. අද ජාතික ග්‍රන්ථ නාමාවලි පිළියෙල වන්නේද එදාට වඩා වෙනස්වය.

ප්‍රසිද්ධ වන ග්‍රන්ථ සංඛ්‍යාවේ විශාලත්වය, විවිධත්වය හා සංකීර්ණත්වය මත ඒ නාමාවලි පිළියෙල කරනු ලැබේ. ශාස්ත්‍රීය කටයුතුවල නිරතවන්නවුන්ට යම්කිසි කර්තෘ වරයෙකු විසින් ලියා ඇති පොත්පත් මොනවාද? යන්න සොයා ගැනීමට අවශ්‍ය විය හැක. එසේ නැතහොත් යම්කිසි විෂයයක් මත ලියැවී ඇත්තේ කුමන පොතපතද යන්න දැන ගැනීමට අවශ්‍ය විය හැක. අසවල් ග්‍රන්ථය ලබා ගත හැක්කේ කුමන ප්‍රකාශක-යන්ගෙන්ද? අසවල් ග්‍රන්ථයේ මිල කීයද? අසවල් ග්‍රන්ථය කොතරම් විශාලද? අසවල් රට ගැන කොතෙක් පොත්පත් ලියැවී ඇත්ද? අසවල් ග්‍රන්ථයේ ඇති සංස්කරණ මොනවාද? එම ග්‍රන්ථය භාෂා කීපයකට පරිවර්තනය වී ඇත්ද? ඒවා පරිවර්තනය කොට ඇත්තේ කා විසින්ද? ඒ පරිවර්තන මුල් භාෂාවෙන් ලියැවූ පොතින් කළ පරිවර්තනද? එසේ නැතහොත් වෙනත් බසකින් කළ පරිවර්තනයක්ද? යනාදිය අද ශාස්ත්‍රීය පර්යේෂණ සම්බන්ධයෙන් නැගෙන සාමාන්‍ය ප්‍රශ්න වෙති.

මේ හැර, පර්යේෂණ විස්තීර්ණ වශයෙන් වර්ධනය වීමත්, එහි පටුත්වය ඇතිවීමත් හේතු කොටගෙන, ඒ ඒ විෂයයන් සම්බන්ධයෙන් අවශ්‍ය වන තොරතුරු වෙනස් මුහුණුවරක් ගනී. උදාහරණයක් වශයෙන් 'ගොවිතැන' නමැති විෂය ක්ෂෙත්‍රය ගනිමු. 'ගොවිතැන' උපාධියක් සඳහා හදාරන ශිෂ්‍යයන්ට අවශ්‍ය වන්නේ ඒ සම්බන්ධයෙන් ලියැවී ඇති සාමාන්‍ය පොතපත්ය. උසස් උපාධියක් සඳහා නම් 'ගොවිතැන' පර්යේෂණ ක්ෂෙත්‍රයක් වශයෙන් විශාල වැඩි හෙයින්, එහි යම්කිසි කුඩා අංශයක් තෝරා ගනු ලැබේ.

'තේ ගස්වලට හැදෙන වසංගත රෝග' උදාහරණයක් වශයෙන් ගනිමු. 'ගොවිතැන' ගැන හදාරණ ශිෂ්‍යයාටත්, 'තේ ගස්වලට හැදෙන වසංගත රෝග' ගැන ගැන හදාරණ පර්යේෂකයාටත් අවශ්‍ය වන තොරතුරු, පොතපත එක සමාන නොවේ. එක් අයෙකුට ගොවිතැන ගැන ලියැවී ඇති සාමාන්‍ය පොත්පත් ප්‍රයෝජන වන අතර, අනික් කෙනාට අවශ්‍ය වන්නේ තේ ගස්වලට හැදෙන වසංගත රෝග ගැන ලියැවී ඇති ලිපි ලේඛන හා පොත් යනාදියද, ඊට සම්බන්ධතාවයක් ඇති ආශ්‍රිත විෂය ක්ෂෙත්‍ර සම්බන්ධ ලිපිත් පමණය. එහෙයින් පොතපත ගැන සකස් වෙන උපකාර ග්‍රන්ථ වන ග්‍රන්ථ කෝෂ ඒ ඒ නානාතිරම්වල ශාස්ත්‍රඥයන්ගේ උවමනාවන් අනුව සකස් විය යුතුය.

ඉතාම සූක්‍ෂම විෂයයක් සඳහා සකස් කරන ලද උපකාර ග්‍රන්ථයක් ප්‍රයෝජනවත් වන්නේ ඉතාම සූක්‍ෂම විෂයයක් සම්බන්ධ පර්යේෂණ කරන්නන්ටය. එසේම සාමාන්‍ය නාමාවලියක් ප්‍රයෝජනවත් වන්නේ සාමූහික වශයෙන් විෂයයක් හෝ විෂයයන් සම්බන්ධ සැලකිල්ලක් දක්වන අයටය.

## මූලික උපකාර ග්‍රන්ථය

ජාතික ග්‍රන්ථ නාමාවලිය යම්කිසි රටක නිෂ්පාදනය වන මූලික උපකාර ග්‍රන්ථය හෙයින්ද, සූක්‍ෂම විෂයයන් සම්බන්ධයෙන් පවා ලියැවෙන පොතපත තෝරා ගැනීමට ඇති එකම මාර්ගය එය හෙයින්ද, යටකී අවශ්‍යතාවයන් සියල්ල හැකි තරම් දුරට ඉටු කිරීමට ප්‍රයත්නයක් දැරීම අත්‍යවශ්‍ය කරුණකි. එසේ සකස් වන ග්‍රන්ථ කෝෂය ඉතාම පුළුල් පාඨක සංඛ්‍යාවකටත් ඉතා පෘථුල විමර්ශන කාර්යයන් සඳහාද ප්‍රයෝජනවත් වන්නේය.

රට තුළ ප්‍රසිද්ධ වන රජයේ ප්‍රකාශනත්, ග්‍රන්ථ ව්‍යාපාරිකයන් විසින් ප්‍රසිද්ධ කරනු ලබන පොත්පත් මහජනයා මහජනයාටත්, පර්යේෂකයින්ටත්, පුස්තකාල විද්‍යාඥයින්ටත් අවශ්‍ය වන පරිදි, ඒ ඒ පොතපත පිළිබඳ අවශ්‍යයෙන්ම දතයුතු විස්තර සටහන් කෙරෙන හෙයින් එය පොත්පත් තෝරා ගැනීමේ ඉතාම පහසුම මාධ්‍ය වන්නේය.

මෙකී පාඨකයිනට හා නිලධාරීනට අවශ්‍ය වන විස්තර එකාකාර නොවන හෙයින්, බොහෝ ජාතික ග්‍රන්ථ නාමාවලි කර්තෘ නාම, ග්‍රන්ථ නාම හා විෂයානුකූලව සකස් කරනු ලැබේ.

එය හුදු පොත් ලැයිස්තුවක් නොවේ; රටෙහි ඕනෑම පෙදෙසක ඕනෑම කෙනෙකුට, පොතපත පිළිබඳ ඕනෑම තොරතුරක් ලබා ගැනීමට එයින් හැකි විය යුතුය. ජාතික ග්‍රන්ථ නාමාවලිය රටක බිහි වන සාහිත්‍ය, නවීන විද්‍යාව, දේශපාලනය, දර්ශණය, කලාව හා වෙනත් එවැනි බොහෝ තොරතුරු සටහන් කොට තබන චිරස්ථිත සටහනක් වනුයේ එදිනෙදා මුද්‍රණද්වාරයෙන් බිහි වෙන පොතපත නැති වී

... හෝ විනාශ වී යාමට පෙර නාමාවලිගත කෙරෙන හෙයිනි.

මෙම ලේඛනයට රට අභ්‍යන්තරයේ ඇති සියලු පොත්ගුල්වල තැන්පත් වී ඇති පොතපත ඇතුලත් විය යුතුය. මේ අයුරින් සකස් කරන ලද ග්‍රන්ථ නාමාවලිවලින් ලෝකයේ ශ්‍රේෂ්ඨ පුස්තකාලවල ආරක්ෂා වෙමින් පවතින අප්‍රමාණ වූ ශාස්ත්‍රීය කෝෂ්ඨාගාර -යනට ආලෝකය විහිදේ. ව්‍යවහාර ග්‍රන්ථ නාමාවලියක් වශයෙන් එවැනි ලේඛනයක් අඛණ්ඩව පවත්වාගෙන ගියහොත්, එය ජාතියේ සාහිත්‍ය ඉතිහාසයේ වැදගත්ම වංශ කතාව වනු ඇත. විද්‍යාවක් වශයෙන් ග්‍රන්ථ කෝෂ විද්‍යාවේ සාරූප්‍යතාවයක්ද මේ හෙයින් ඇතිවේ.

රටක පුස්තකාල සේවයේ ඇති ග්‍රන්ථ විස්තර සැපයීමේ ක්‍රම, වර්ග කිරීමේ ක්‍රම යනාදිය පිළිබඳ පුස්තකාල නිලධාරීන් විසින් ජාතික ග්‍රන්ථ නාමාවලිය සාධිකාරී ලේඛනයක් වශයෙන් සලකනු ලැබේ. එය පුස්තකාල නිලධාරීන්ගේ වෘත්තීය මෙවලමක් වන්නේය. පුස්තකාල විධි ක්‍රමවල සාරූප්‍යතාවයක්ද ඇති වන්නේය.

**ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ නාමාවලිය**

÷ මහජන පුස්තකාල ÷ විශ්ව විද්‍යාල පුස්තකාල ÷ පාසල් පුස්තකාල ÷ විශේෂ පුස්තකාල ÷ ළමා පුස්තකාල ÷

÷ සාමාන්‍ය පාඨකයා ÷ විමර්ශණ අවශ්‍යතා ÷ පර්යේෂණ කටයුතු සඳහා ÷ සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි පොත් පත් තෝරා ගැනීමට ÷ ශ්‍රී ලංකාවේ ප්‍රකාශන පිළිබඳ නිවැරදි තොරතුරු දක්වෙන ප්‍රධාන ජාතික ප්‍රකාශනය........

**ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ නාමාවලිය**

වාර්ෂික දායක මුදල රු.45.00 (තැපැල් ගාස්තු සමඟ)

සම්පාදනය සහ ප්‍රකාශනය : ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය විසිනි.

# National Digitization Project

## *National Science Foundation*

Institute : National Library and Documentation Services Board

1. Place of Scanning : National Library and Documentation Services Board, Colombo 07

2. Date Scanned : 2017/10/13

3. Name of Digitizing Company : Sanje (Private) Ltd, No 435/16, Kottawa Rd, Hokandara North, Arangala, Hokandara

4. Scanning Officer

Name : N.P.R. Gamage

Signature : ............

Certification of Scanning

*I hereby certify that the scanning of this document was carried out under my supervision, according to the norms and standards of digital scanning accurately, also keeping with the originality of the original document to be accepted in a court of law.*

Certifying Officer

Designation : Library Documentation Officer

Name : Iromi Wijesundara

Signature : ............

Date : 2017/10/13

*"This document/publication was digitized under National Digitization Project of the National Science Foundation, Sri Lanka"*